# හිත හොඳ කුරුමිට්ටෝ



**S.M.** චනුදි සංසලා කුමාරි සංගක්කාර

# හිත හොඳ කුරුමිට්ටෝ

කතෘ ප්‍රකාශනයකි.
පළමු මුද්‍රණය 2023 නොවැම්බර් 15
ISBN 978-624-206-795-7

කතාව සහ චිත්‍ර
**S.M.** චනුදි සංසලා කුමාරි සංගක්කාර
2 E, මහමායා බාලිකා විද්‍යාලය

කතෘගේ වෙනත් කෘති
Bella's Magic Pen

# පිදුම

මෙම පොත සැදීමට

මා හට මඟ පෙන්වූ

චාමිනී පල්ලියගුරු ගුරු මැණියන්ටත්,

මාගේ ආදරණීය දෙමාපියන්ටත්

මෙම පොත

ගෞරවයෙන් පුද කරමි!

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර (විදුහල්පතිනිය)

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023. 10.20

ඔන්න එකමත් එක රටක ලස්සන කැලෑවක් තිබුණා. ඒ කැලේ ඇතුලේ ලස්සන කුරුමිට් රාජධානියක් තිබුණා. ඒ රාජධානියේ කුරුමිට්ටෝ හරිම සතුටින් ජීවත් වුණා. එයාලා සමගියෙන් හිටියා.





දවසක් ඒ රටේ රජ්ජුරුවෝ මේ කැලේ මැදින් තනියම ගමනක් ගියා. එතකොට මේ රජතුමාට හිතුණා මට මේ කැලය කපලා තව ලස්සන මාලිගාවක් හදන්න ඕනේ, එතකොට මාලිගා ගොඩයි. එහෙම හිතපු රජතුමා කුරුම්ටි රාජධානියට ගිහිල්ලා

කැලේ කපනවා කියලා
කුරුමිට්ටන්ට කිව්වා.
අනේ කුරුමිට්ටෝ
ඔක්කොම ඇඬුවා.
ගොඩක් දුක් වුණා. කැලේ
කපන්න එපා කිවුවා. අපේ
ගෙවල් නැතිවෙයි කිවුවා.





එත් රජතුමා කිසිම දෙයක් ඇහුවේ නෑ.කුරුමිට්ටන්ට ගොඩාක් බැනලා එතනින් පිටත් වුණා. ටිකක් දුර යනකොට රජතුමාට බඩගිනි වුණා. ගෙඩි පිරිච්ච ගහකින් ගෙඩියක් කෑවා. රජතුමාට සිහිය නැතිවුණා. අශ්වයා කෑ ගැහුවා. කුරුමිට්ටෝ ඉක්මනට ආවා.



කුරුම්ට්ටෝ දැක්කා රජතුමා වැරදිලා විෂ ගෙඩි කාලා කියලා. කුරුම්ට්ටෝ එකතු වෙලා රජතුමාව උස්සන් ගියා. එයාලා ළඟ තිබුණ බෙහෙත් පෙවුවා. එකතු කරපු මී පැණි ඔක්කොම රජතුමාට පෙවුවා. ටිකකින් රජතුමාට සිහිය ආවා. කුරුම්ට් නායකයා

රජතුමාට වෙච්චි දේ කිව්වා. රජතුමා ගොඩක් ඇඬුවා. කුරුමිට්ටන්ගෙන් සමාව ඉල්ලුවා.



රජතුමාගේ ජීවිතය බේරුවට ගොඩාක් ස්තූති කළා. ඒ කරපු උදව්වට කිසිම දවසක කැලේ කපන්නේ නෑ කියලා කුරුමිට්ටන්ට රජතුමා පොරොන්දු වුණා. හැමෝම සතුටින් ජීවත් වුණා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20